# <u>දකුණු පළාත් සභාව</u>
## <u>2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

2026 වර්ෂය සඳහා දකුණු පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වලට අවශ්‍ය භාණ්ඩ, වැඩ හා සේවා සැපයීම සඳහා ලියාපදංචි වීමට කැමැත්තක් දක්වන සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා සේවා සම්පාදකයන් වෙතින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ලියාපදිංචි කිරීම https://www.cs.sp.gov.lk/isupply-sysg යන මාර්ගගත මාදුකාංගය මඟින් සිදු කරන ලබන අතර, ලියාපදිංචි වීම් සඳහා අයදුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු www.cs.sp.gov.lk යන ප්‍රධාන ලේකම් වෙබ් අඩවියෙන් හා https://www.cs.sp.gov.lk/isupply-sysg යන ඉහත මාර්ගගත මෘදුකාංගයට පිවිසීමෙන් ලබා ගත හැක.

**01). කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**

<u>සුදුසුකම්</u>

I). දකුණු පළාත තුළ ස්වකීය ව්‍යාපාර හෝ ශාඛා ආයතන පවත්වාගෙන යන කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි විය හැකි අතර " **ඉදිකිරීම් සඳහා සෑම කොන්ත්‍රාත්කරුවෙක්ම <u>ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)</u>** " ආයතනයේ ලියාපදිංචි වී සිටිය යුතුය.(මේ සඳහා වන ලියාපදිංචි සහතිකය ස්කෑන් (scan) කර මාර්ගත මෘදුකාංගයට ඇතුලත් කළ යුතුය.)

**02). සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.**

<u>සුදුසුකම්</u>

1.) ව්‍යාපාර ලියාපදංචි සහතිකය.
II.) ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු විශේෂ බලපත්‍ර හෝ අවසර පත්‍ර.
III.) ආපනශාලා සම්බන්ධයෙන් නම් මහජන සෞඛ්‍ය පරීක්ෂක / සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගේ සහතිකය .
IV.) වැට් (VAT) ලියාපදිංචි සහතිකය.
**ඉහත අදාල ලේඛන/සහතික ස්කෑන් (scan) කර මාර්ගගත මෘදුකාංගයට ඇතුලත් කල යුතුය.**

**03). විශේෂ උපදෙස්**

දකුණු පළාත් සභාවට අයත් සියලුම ආයතන විසින් වර්ෂය පුරා භාණ්ඩ,වැඩ හා සේවා සපයා ගැනීමේ දී මෙම සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචි ලේඛනය භාවිතා කර ලංසු ආරාධනා සිදු කරනු ලබන බැවින් මාර්ගගත මෘදුකාංගය ඔස්සේ නිසි පරිදි අයදුම් පත සම්පූර්ණ කර අදාල සහතික වල ස්කෑන් (scan) කරන ලද ඇමුණුම් ද සහිතව ලියාපදිංචි වීම සිදු කරන ලෙස සියලු සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා සේවා සම්පාදකයන් වෙත උපදෙස් දෙනු ලැබේ.

**04.) අයදුම්කිරීම හා ලියාපදිංචි කිරීම සඳහා උපදෙස් .**

- ලියාපදිංචි කිරීම **2025.09.24 දින සිට 2025.11.28** දින දක්වා දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් **ලියාපදිංචි කිරීම සඳහා වන මාර්ගගත මෘදුකාංගය ඔස්සේ සිදු කල යුතුය.**

- එක් ව්‍යාපාරයක්/ආයතනයක් සඳහා එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කල යුතු අතර එක් අයදුම්පතක් මගින් අයිතම එකක් හෝ ඊට වැඩි ඕනෑම ප්‍රමාණයක් සඳහා ලියාපදිංචි වීම සිදු කල හැකිය.

- **එක් අයිතමයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු රු: 500/- කි** . අයදුම්පතක් මගින් ඉල්ලුම් කරනු ලබන අයිතම ප්‍රමාණයට අදාලව එකක් සඳහා රු.500/- බැගින් වන මුලු මුදල, ප්‍රධාන ලේකම්, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය නමින් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සරප් වෙත හෝ පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දකුණු පළාත් සභාවට අයත් අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තුවකට (දකුණු පළාත් සභාව නමින් ලදුපතක් නිකුත් කළ හැකි රජයේ පළාත් සභා ආයතනයකට) ගෙවා ලැබෙන ලදු පතෙහි මුල් පිටපත ස්කෑන් (scan) කර මාර්ගගත මෘදුකාංගය වෙත ඇතුලත් කල යුතුය. නැතහොත් අදාල ලියාපදිංචි ගාස්තුව **ප්‍රධාන ලේකම් දකුණු පළාත නමින් ලංකා බැංකුව, ගාල්ල, කොටුව ශාඛාවෙහි ඇති ගිණුම් අංක 1587305 දරන ගිණුමට** බැරකර රිසිට් පත මාර්ග ගත මෘදුකාංගය ඔස්සේ ස්කෑන් (scan) කර ඉදිරිපත් කළ යුතුය.

**වෙනත් කොන්දේසි :-**

01. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ලංසු/යෝජනා මිල ගණන් කැඳවීම, ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කරනු ලබන අතර දකුණු පළාත් සභාවේ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු / යෝජනා මිල ගණන් කැඳවීමේ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

02. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත්‍රය සලකා බලා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙත ඇති හැකියාවන් සහ සුදුසුකම් මත පමණක් එකී අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය හා හේතූන් නො දන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතුය.

03. යම් සැපයුම්කරුවෙකු ගේ/ කොන්ත්‍රාත්කරුවෙකු ගේ සේවය සැපයීම පිළිගත නො හැකි මට්ටමට දුර්වල තත්ත්වයක පවතින්නේ නම් හෝ සැපයුම්/ කොන්ත්‍රාත් කටයුතු කිරීමේ දී යම් වංචාසහගත ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවයක යෙදුන බවට තහවුරු වුවහොත්, එම ආයතන අසාධු ලේඛනයට ඇතුළත්කොට, මින් ඉදිරියට සැපයුම්කරුවකු/ කොන්ත්‍රාත්කරුවෙකු ලෙස පිළිනොගැනීමට කටයුතු කළ හැකිය. ඒ පිළිබඳ වූ පූර්ණ අයිතිය දකුණු පළාත් ප්‍රධාන ලේකම් සතු වන්නේය.

04. සියලුම අයදුම්කරුවන් සුදුසුකම්, හැකියාවන් හා යෝග්‍යතාවයන් සපුරා ඇතැයි යන උපකල්පනය මත, ලියාපදිංචිය සිදු කරනු ලබන අතර එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලියන්හි දී සුදුසුකම් සපුරා නොමැති සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්පත් බාරගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ලියාපදිංචි කිරීම සෑම මාස 03 කට එක් වරක් සිදු කරනු ලබන අතර එලෙස ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සඳහා එක් අයිතමයකට ලියාපදිංචි වීමේ ගාස්තුව ලෙස රු.1,000.00 ක් අයකරනු ලැබේ.

06. දකුණු පළාත් සභාවේ ආයතන විසින් ඉදිරියේ දි සිදු කරන ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය (E-GP) අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බැවින් සියලු සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් විසින් අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ (promise.lk) ලියාපදිංචි වීම අත්‍යාවශ්‍යය වේ. www.promise.lk වෙත පිවිසීමෙන් මෙම පද්ධතිය සඳහා ලියාපදිංචි විය හැක.

07. ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් වෙතොත්, 091- 4946368/ 091- 4944016/ දුරකථන අංක ඇමතීමෙන් හා procurementplan1@gmail.com යන විද්‍යුත් තැපැල මගින් විස්තර ලබා ගත හැකිය.

සභාපති,
ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
දකුණු පළාත.
දිනය :- 2025.09.24